# දැන්වීමයි

## සුහසාධන වෛද්‍ය ක්‍රමය - 2025

## අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම ස්ථිර සාමාජික සාමාජිකාවන් වෙත.

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයේ ස්ථිර සාමාජික සාමාජිකාවන් සඳහා දැනට ක්‍රියාත්මක වන සුහ සාධන වෛද්‍ය ක්‍රමය **2025.01.01 දින සිට 2025.12.31** දින දක්වා පහත සඳහන් යෝජනා ක්‍රම ත්‍රිත්වය යටතේ තවත් වසරක කාලයකින් දීර්ඝ කර ඇති බව සතුටින් දන්වමි.

| | |
|---|---|
| I යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. **2,400/-** ක මුදලක් අවුරුද්දක කාල සීමාවක් සඳහා සඳහා එකවර හෝ මාසික වාරිකය බැගින් ඔබගේ වැටුපෙන් අඩුවෙන පරිදි ගෙවිය යුතුය. (මසකට රු. **200/-**_බැගින්) |
| II යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. **7,200/-** ක මුදලක් අවුරුද්දක කාල සීමාවක් සඳහා සඳහා එකවර හෝ මාසික වාරිකය බැගින් ඔබගේ වැටුපෙන් අඩුවෙන පරිදි ගෙවිය යුතුය. (මසකට රු. **600/-**_බැගින්) |
| III යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. **12,000/-** ක මුදලක් අවුරුද්දක කාල සීමාවක් සඳහා සඳහා එකවර හෝ මාසික වාරිකය බැගින් ඔබගේ වැටුපෙන් අඩුවෙන පරිදි ගෙවිය යුතුය. (මසකට රු. **1,000/-**_බැගින්) |

- **2024 සුහසාධන වෛද්‍ය යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වූ සියලුම සාමාජික මහත්ම මහත්මීන් නැවත 2025 වර්ෂය සඳහා ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.**

- **2024 සුහසාධන වෛද්‍ය යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වී ඇති සියලුම සාමාජික මහත්ම මහත්මීන් ලියාපදිංචි වී සිටින යෝජනා ක්‍රමයම නැවත 2025 වර්ෂයටත් නොවෙනස්ව පවතින අතර දැනට ලියාපදිංචි වී සිටින යෝජනා ක්‍රමය වෙනස් කිරීමට නොහැකි බව ද කාරුණිකව දන්වා සිටිමු.**

- **2025 සුභසාධන වෛද්‍ය ක්‍රමය සඳහා ලියාපදිංචි වීම සඳහා බලාපොරොත්තු වන නවක සාමාජික මහත්ම මහත්මීන් නිසි පරිදි පුරවන ලද අයදුම්පත් හා ඊට අදාල ලේඛන ද අමුණා අධ්‍යයන ආයතන අංශයේ / අනධ්‍යයන ආයතන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් සහතික කර 2025.01.31 දින හෝ එදිනට පෙර ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය.**

ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය
2024 දෙසැම්බර් මස 27 වැනිදා